FPA SRI LANKA
enriching relationships

# පුවත් සංග්‍රහය

2011 පළමුවන කලාපය

www.fpasrilanka.org

## සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථ (MDG) - 5b ජය ගැනීම...

# රටේ අවශ්‍යතා හඳුනාගත් පුළුල් මෙහෙවරක්...



තුෂාරා ආගුස්
FPA ශ්‍රී ලංකා විධායක අධ්‍යක්ෂිකා

"රටේ - සමාජයේ අවශ්‍යතා කාලයෙන් කාලයට වෙනස් වෙනවා. ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමය, "පවුල් සැලසුමට" පමණක් සීමාවූ ආයතනයක් නොවෙයි. පුළුල් ලෙස සමාජ අවශ්‍යතාවන් හඳුනාගෙන ඒ සඳහා වැඩ කිරීමට අවශ්‍ය වෙනවා."

විශේෂයෙන්ම යෞවන යෞවනියන්ට ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය දැනුම ලබාදීම, තීරණ ගන්නන්, ප්‍රතිපත්ති සම්පාදකයින් සඳහා අධිවාචන වැඩසටහන් පැවැත්වීම ආදිය පිළිබඳ විශේෂ අවධානය යොමු කළ යුතුය.

අද, 'තමන්ගේ ප්‍රජනක හා ලිංගික අයිතිවාසිකම්' ගැන කථා කරන කාලයක අප ඉන්නෙ. අනාගතයට අපේ තරුණ-තරුණියන් දැනුමෙන් අවබෝධයෙන් යුතුව සුදනම් කළ යුතුයි. ඔවුන්ට ඇති වගකීම් ගැන අවබෝධයක් තිබිය යුතුයි එසේ නැති වුවහොත් විවිධාකාර උපකරණ සහ තාක්ෂණය සමඟ ඔවුන් පහසුවෙන් විනාශකාරී මගකට යොමු විය හැකියි. මේ සඳහා අධ්‍යාපනික පසුබිම නිවැරදිව සකස් විය යුතුයි.

04 පිටුවට......




HIV/AIDS පිළිබඳව අවධානය යොමු කිරීමට Let's Talk වැඩසටහන සඳහා භාවිත කළ පෝස්ටරය

2011 ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලියට සමගාමීව HIV/AIDS පිළිබඳ ප්‍රචාරක වැඩසටහනක් Let's Talk ලෙස ක්‍රියාත්මක විය. මෙහි HIV /AIDS පිළිබඳ දැනුවත් කිරීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකා හිටපු ක්‍රිකට් නායක කුමාර සංගක්කාර කටයුතු කළේය.

UNICEF, UNAIDS, ICC ආයතන, සමඟ FPA ශ්‍රී ලංකා ආයතනයද මෙම ප්‍රවර්ධන වැඩසටහන සඳහා එක්ව සිටියේය.

**පවුල් සෞඛ්‍ය මධ්‍යස්ථානය**
**011 2 555 455**

# "ලියසවියෙන්" සවිමත් වූ අපේ යුවතියන්..

අම්පාර හා මඩකලපුව දිස්ත්‍රික්කයන්හි ක්‍රියාත්මක කළ ලියසවිය ව්‍යාපෘතියට සම්බන්ධ වූ තරුණියන් දෙදෙනෙකුගේ අදහස් . . .
මෙම තරුණියන් සම වයස් කණ්ඩායම් දැනුවත් කිරීමෙහි නිරත විනි.



"අප සහභාගී වූ දින තුනක වැඩ මුළුවෙන් සමාජයේ පවතින ගැටලු සහ ඒවාට මුහුණ දීම පිළිබඳ අවබෝධයක් ලැබුණා. තරුණයින්ගේ මානසිකත්වය පිළිබඳවත්, තරුණයින් අනවශ්‍ය තත්ත්වයන්ගෙන් ගලවා ගැනීමටත් මට හැකිවේ යැයි සිතනවා. වීඩියෝ කැමරාව භාවිතය ගැන කිසිදු අවබෝධයක් නොතිබුණු මට කැමරාව භාවිතයත් චිත්‍රපටයක් සකස් කිරීමත් පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට හැකි වුනා."

**එස්. වනීතා - මල්ලාඩිතිව්, කොක්කඩිචෝලෙයි.**



"මට ලැබුණු පුහුණුව මගේ පෞද්ගලික ජීවිතයට ඉතා ප්‍රයෝජනවත් වන්නක්. නව යොවුන් වියේ අනවශ්‍ය ගැබ් ගැනීම් පිළිබඳව ඇතිවන තත්ත්වයන් ගැනත් හොඳ අවබෝධයක් ලැබුණා. මා ජීවත්වන ප්‍රදේශයේ එවැනි නව යොවුන්වියේ අනවශ්‍ය ගැබ්ගැනීම් අවම කරන්නට මට යම් දායකත්වයක් ලබාදීමට හැකිවේවි. HIV පිළිබඳවත්, එයින් ආරක්ෂා වියහැකි ආකාරය ගැනත් ලබාදුන් දැනුමත් ඉතා වටිනවා."

**එස්. සජේෂ්කා - මුන්නෙයිකඩු, කොක්කඩිචෝලෙයි.**



# හිටපු විධායක අධ්‍යක්ෂතුමන්ට අපගේ සුබ පැතුම්

FPA ශ්‍රී ලංකා ආයතනයේ විධායක අධ්‍යක්ෂවරයා ලෙස වසර 4ක් සුවිශේෂ කාර්යභාරයක නිරත වූ ගාමිණී වනසේකර මහතා එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදලේ UNFPA සහකාර ශ්‍රී ලංකා නියෝජිත ලෙස පසුගිය ද වැඩ බාරගන්නා ලදි.

ගාමිණී වනසේකර මහතා අලෙවි සහ පුහුණු අධ්‍යක්ෂ, නියෝජ්‍ය විධායක අධ්‍යක්ෂ යන තනතුරු හොබවමින් වසර 9කට ආසන්න කාලයක් FPA ශ්‍රී ලංකා ආයතනයේ කටයුතු කළේය.

තොරතුරු මධ්‍යස්ථානයේ ආරම්භය, යොවුන් මිතුරු මධ්‍යස්ථාන පිහිටුවීම, Happy Life වෛද්‍ය උපදෙස් ලබාදීමේ සේවාව ඇරඹීම, වෛද්‍ය ග්‍රන්ථ ගණනාවක් අලෙවිය සඳහා ප්‍රකාශයට පත්කිරීම වැනි සුවිශේෂ කාරණා රැසක් වනසේකර මහතාගේ මූලිකත්වයෙන් සිදුවිය.

# HIV දැනුම මිනුම ජයග්‍රාහකයින් තෝරාගැනීම...




2011 ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලිය වෙනුවෙන් ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලය UNAIDS සහ UNICEF මගින් ක්‍රියාත්මක කළ HIV පිළිබඳ ප්‍රචාරක වැඩසටහන යටතේ එච්. අයි. වී. / ඒඩ්ස් පිළිබඳව ප්‍රශ්න සඳහා පිළිතුරු එවූ පිරිස අතුරින් ජයග්‍රාහකයින් තෝරාගැනීම ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ දී පැවැත්විය.

**මෙම අවස්ථාවට (ඡායාරූපයේ වමේ සිට) UNICEF ආයතනයේ සුසෑන් ඩාවේ මිය, UNAIDS ආයතනයේ ඩේවිඩ් බ්‍රිජර් මහතා, FPA ශ්‍රී ලංකා නියෝජ්‍ය විධායක අධ්‍යක්ෂ ලසන්ත ගුණරත්න මහතා සහ අධිචාචන අධ්‍යක්ෂිකා මදුෂා දිසානායක මහත්මිය එක්වූ අවස්ථාව.** ජයග්‍රාහක ජයග්‍රාහිකාවන්ට ලෝක කුසලාන අවසන් පූර්ව තරගය නැරඹීමට ප්‍රවේශපත් ලබාදෙන ලදි.

# ජනපති ආර්යාවට FPA ප්‍රකාශන පිරිනැමීම



FPA ශ්‍රී ලංකා ආයතනය මගින් ප්‍රකාශයට පත් ග්‍රන්ථ කිහිපයක් ජනාධිපති ආර්යා ශිරන්ති රාජපක්ෂ මහත්මියට FPA ශ්‍රී ලංකා සභාපති විශේෂඥ වෛද්‍ය ප්‍රාමිලා සේනානායක මහත්මිය විසින් ජාතික තරුණ සේවා සභාවේ පැවති එච්. අයි. වී. / ඒඩ්ස් පිළිබඳ කොළඹ දිස්ත්‍රික් තරුණයින් දැනුවත් කිරීමේ වැඩසටහනේදී පිරිණමන ලද අවස්ථාව. ජාතික ලිංගාශ්‍රිත රෝග සහ එච්. අයි. වී. / ඒඩ්ස් මර්දන වැඩසටහන සංවිධානය කළ මෙම අවස්ථාවට FPA ශ්‍රී ලංකා - Happy Life මගින් ප්‍රචාරක අනුග්‍රහය ලබා දෙන ලදි.

# ජාත්‍යන්තර ජයග්‍රහනයක් හිමිකර ගත් අපේ තරුණයා - මිලින්ද



**ජාත්‍යන්තර සැලසුම් කළ මාපියභාවය පිළිබඳ සම්මේලනයේ ගරු සභාපතිනි ජැකලින් ෂාර්ප් මහත්මිය සහ විධායක අධ්‍යක්ෂිකා ජිල් ග්‍රියර් මහත්මිය සමග මිලින්ද රාජපක්ෂ මහතා**

තරුණයින්ගේ ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය වෙනුවෙන් කරන ලද සේවය සඳහා, ජාත්‍යන්තර සැලසුම් කළ මාපියභාවය පිළිබඳ සම්මේලනය එහි **වාර්ෂික තරුණ සම්මානය (2010)** මිලින්ද රාජපක්ෂ මහතා වෙත පිරිනමන ලදි. ඒ මහතා ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ යොවුන් කමිටුවේ හිටපු සභාපතිවරයෙකි. සම්මානය පිරිනැමීම ලන්ඩනයේදී සිදුවිය.

විශේෂඥ මනෝ වෛද්‍ය කපිල රණසිංහ මහතා විසින් සම්පාදිත ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමය විසින් ප්‍රකාශයට පත් කළ "යුවළ සම්බන්ධතා මඟ පෙන්වීම" ග්‍රන්ථය දෙරඩට වැඩුම දෘ පැවති දේශනයක් ඇසුරෙනි.

# යුරෝපයට කලින් අප ලිංගික විද්‍යාව ගැන දැනුවත්ව සිටියා



විශේෂඥ මනෝ වෛද්‍ය ඩී.වී. ජේ. හරිස්චන්ද්‍ර

**"මනෝ වෛද්‍ය කෙෂ්ත්‍රයේ කෙනෙකු මෙවැනි ඉතාම හොඳ පොතක් ලියා තිබීම ඉතාම වටිනා දෙයකි. ඉතිහාසයේ කිසිම දිනක නැති මිත්‍යා විශ්වාස වලින් මේ රට දැන් පිරිලා තිබෙන්නේ. මේවාට ඇත්ත වශයෙන්ම මාධ්‍යයත් වගකිව යුතුයි."**

නිවැරදි විද්‍යාත්මක දේ විශේෂයෙන්ම මනෝ වෛද්‍ය විද්‍යාත්මක දේ, මෙලෙස හොඳින් කියවන්නට හැකි පොතක්, තිබීම වටිනා දෙයක්. බොහෝ අය අතර මිත්‍යාමත පවතිනවා. එකක් තමයි සංසර්ගය. ස්වයං වින්දනය, පුරුෂ ලිංගයේ ප්‍රමාණය පිළිබඳ මිත්‍යාමත බොහෝවිට පවතිනවා.

**ඉතිහාසයේ කිසිම දිනක නැති**
**මිත්‍යා විශ්වාස වලින් මේ රට දැන් පිරිල....**

මොළයේ එක්තරා කොටසක නියෝජනය වෙලා තියෙන්නේ ලිංගේන්ද්‍රිය සහ මුඛය. මේ නිසා මුඛය සහ ලිංගේන්ද්‍රය අතර යම් සම්බන්ධතාවක් පවතිනවා. එසේම **ලිංගික ක්‍රියාව වැදගත්වන්නේ ආදරය ප්‍රකාශ කිරීමට සහ ආතතිය පහකර ගැනීමට.** අසභ්‍ය වචන ආතති පහකර ගැනීමට එක් ක්‍රමයකි. ඇරිස්ටෝටල් ග්‍රීසියේ වැසියන්ට කිව්වේ හැමදම හොඳ රංගනයක් බලන්න කියාය. රංගනයේ නළු නිළියන්ගේ ආතති, තමාගේ ආතති බවට තදාත්මීකරණය නිසා ඇතිකරගෙන උච්චම අවස්ථා හැටියට ලිහා දමනවා. එයමයි ලිංගික ක්‍රියාවේ තිබෙන්නේත්; අසභ්‍ය වචන කීමේ තිබෙන්නේත්.

දේවානම් පියතිස්ස යුගයේ අපේ රටේ ජනතාවට මෙම ලිංගික ක්‍රියා පිළිබඳව ඉතා හොඳ දැනුමක් තිබුණා. ලිංගිකතාව පිළිබඳව කරුණු ලියා ඇති තවත් විශිෂ්ට ග්‍රන්ථයකි ත්‍රිපිටකය.

ලිංගික විද්‍යාව පිළිබඳ අපේ රටේ අය යුරෝපයට කලින් දැනුවත් වී තිබුණා. විශේෂයෙන්ම පන්සිය පනස් ජාතක පොතේ නොයෙක් තැන්වල මේ ලිංගික ක්‍රියාව එලෙසම සිංහලෙන් පැහැදිලිව ලියා තිබෙනවා.

4 වන පරාක්‍රමබාහු රජතුමාගේ කාලයේදී 14වන ශත වර්ෂයේදී සිංහලෙන් ලියපු ජාතක පොතේ කිසිවිටක මේවා සඟවන්නේ නැතිව ලියා තිබුණා. ජාතක පොතේ කාමාස්වාදය, කාමරති, කාමරතිසුව, අභිරමණය, මෛථුනය සංසර්ගය වැනි වචන තිබෙනවා. කාමාශාව පිළිබඳව බොහෝ ලියා තිබෙනවා. බුදුදහමේ හරය, නිවන, කාමාශාව නැතිකර ගන්නා ආකාරයයි. ත්‍රිපිටකයේ පාරාජිකා පාලියේ මුලින්ම මේ ගැන සඳහන් වෙනවා.

ශ්‍රී ලංකාවේ මට හමුවී තිබෙනවා නෙක්‍රොෆීලියා රෝගීන් දෙන්නෙක්. වෙනත් රටවල දහස් ගණන් සිටිය හැකිය. මේවා බුදුරජාණන් වහන්සේගේ කාලයේත් තිබුණා. මල සිරුරක් දුටුවිට අමු සොහොනක සංසර්ගයේ යෙදීම ඒ දවස්වල තිබුණා.

**ලිංගික ක්‍රියාව වැදගත්වන්නේ, ආදරය ප්‍රකාශ**
**කිරීමට සහ ආතතිය පහකර ගැනීමට.**

මෑත අතීතයේ අපේ රටේ බොහෝ කවින්, රසවත් කවි ඒ පිළිබඳ ලියා තිබෙනවා. ලිංගිකතාව ගැන කථා කරන විට මූලික කාරණා දෙකක් සැලකිය යුතුයි. එකක් ආදරය ප්‍රකාශයක්. දෙවැනි එක ප්‍රීතිය, සතුට. එය ප්‍රීතියට සතුටට පත්විය යුතු දෙයක්. භයට පත්විය යුතු දෙයක් නොවෙයි. පිළිකුලට පත්විය යුතු දෙයකුත් නොවෙයි.

# අම්පාර කාර්යයන් නිරීක්ෂණය



අම්පාර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කෙරෙන ලියසවිය ව්‍යාපෘතියේ කාර්යයන් පිළිබඳව ක්ෂේත්‍ර නිරීක්ෂණයක් අධීක්ෂණ සහ ඇගැයීම් ඒකකය මඟින් සිදුකරන ලදි. මේ සඳහා අම්පාර දිස්ත්‍රික්කයේ පොල්වත්ත පවුල් සේවා නිලධාරිනී කොට්ඨාසය තෝරා ගැනුණි.

මෙහි පැවැති ජංගම වෛද්‍ය සායනය සඳහා පැමිණි තරුණියන් හා සෞඛ්‍ය කාර්ය මණ්ඩල සමඟ කුඩා කණ්ඩායම් සාකච්ඡා පැවැත්වීමෙන් තොරතුරු ලබා ගැනීම සිදුවිය.

**සහකාර අධ්‍යක්ෂ සුචිර සුරංග මහතා සහ කළමණාකාර දුමින්ද රාජකරුණ මහතා විසින් මෙහෙයවන ලදි.**

ජාතික තරුණ සෞඛ්‍ය ප්‍රතිපත්තිය සකස් කිරීම - බදුල්ල දිස්ත්‍රික්ක රාජ්‍ය නිළධාරීන් සඳහා අධිවාචන වැඩමුළුව

# රටේ සංවර්ධනයට උරදෙන සෞඛ්‍ය සම්පන්න තරුණ පිරිසක් තනමු

බදුල්ල දිස්ත්‍රික්ක ලේකම් - රෝහණ කීර්ති දිසානායක






බදුල්ල දිස්ත්‍රික්ක ලේකම් - රෝහණ කීර්ති දිසානායක මහතා සභාව අමතන අවස්ථාව.
වම් ඡායාරූපයේ - බදුල්ල දිස්ත්‍රික් ළමා හා මාතෘ සෞඛ්‍ය වෛද්‍ය නිළධාරිනි ශිරෝමී ද සිල්වා මහත්මිය, අධිවාචන අධ්‍යක්ෂිකා මදුෂා දිසානායක මහත්මිය සහ විධායක අධ්‍යක්ෂ තුෂාරා ආගුස් මහත්මිය
දකුණු ඡායරූපයේ - බදුල්ල දිස්ත්‍රික් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 15 ක් නියෝජනය කරමින් පැමිණි නිළධාරීන්

"මේ වන විට ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ මෙහෙවර වන්නේ අපේ අනාගතය බාර ගැනීමට සිටින යොවුන් පරපුර කායික හා මානසික වශයෙන් නිරෝගී සහ ශක්තිමත්, රටේ සංර්ධනයට උරදෙන ජව සම්පන්න පිරිසක් බවට පත් කරගැනීමේ අවශ්‍ය පසුබිම, අඩිතාලම සකස් කිරීමයි."

බදුල්ල දිස්ත්‍රික්කයේ අපේ යොවුන් පරපුර මුහුණදී ඇති ගැටලු මොනවාදැයි හඳුනාගැනීම මෙම වැඩමුළුවේ එක් අරමුණකි.

බොහෝවිට වත්මන් වැඩිහිටියන්ගේ සමාජ විරෝධී ක්‍රියාකාරකම් තුළ ඒවාට කණස්සල්ල පළකිරීම සිදුකෙරෙනවා. අප කළ යුත්තේ , ඊටත් වඩා තවත් වසර ගණනාවකින් සමාජ වගකීම් බාරගන්නා පිරිස තෝරාගෙන සමාජ විරෝධී ක්‍රියාකාරකම් වලට යොමු නොවී බොහෝ හික්මුණු, විනයක් ඇති පිරිසක් බිහිකිරීමයි. තරුණ පිරිස එයට සුදානමක් ඇතිව සමාජගත කළ යුතුයි. එක් ලක්ෂ එක්දහක් වන අපේ යෞවනයන් (බදුල්ල දිස්ත්‍රික්කය) තුළ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම බොහෝ සමාජ වෙනස් කිරීම්වලට හේතුවේ යැයි සිතනවා.

සාර්ථක විවාහ ජීවිතයක් ගත කිරීම සඳහා විශේෂයෙන්ම දැනුම පාසල් වියේදීම ලබාදීමට සෞඛ්‍ය අමාත්‍යංශය අවධානය යොමුකර තිබෙනවා. දැනුම හුවමාරු කරගැනීමට පොතපත, සංවාදවල අවශ්‍යතාව තිබෙනවා.

අඩුවයස් ගැබ්ගැනීම් මෙම ප්‍රදේශයේ ප්‍රබල සමාජ ප්‍රශ්නයක් වී තිබෙනවා.

බොහෝවිට පාසල් වියේ, පාසල් හැරගිය දියණියන් මෙයට ගොදුරුවී තිබුණා. අසැබි වීඩියෝ සහ පොත්පත් පරිශීලනයට අවස්ථාව ලැබීම මෙයට හේතුවක්.

තරුණයින් සඳහා ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තියක් සකස් කිරීමට සූදානම් වන මොහොතේ, නොමගට යොමුකරන බලපෑම් කණ්ඩායම් හඳුනාගෙන ඔවුන් කෙරේ මැදිහත් වීමක් කළ යුතුයි. රටේ සංවර්ධනය ගැන, ආසියාවේ ආශ්චර්යවත් රට බවට පත්කිරීම සඳහා සූදානම්වන මොහොතක, ඊට යෞවන-යෞවනියන්ගේ නිර්මාණශීලිත්වයත්, නිරවුල් මානසික හා කායික සෞඛ්‍යයකින් පිරිසක් බවට පත්කිරීමටත් අනාගත අභිවෘද්ධියටත් මෙම වැඩ සටහන හේතුවේ යැයි සිතනවා.

---

01 පිටුවෙන්......

## රටේ අවශ්‍යතා හඳුනාගත්....

ඒ සඳහා අපට කළ හැකි දයකත්වය කුමක්ද? මෙම දැනුම, මඟපෙන්වීම ලබාදීමට පාසල් අධ්‍යාපනයට ගුරුවරුන් පුහුණු කළ යුතුද? ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය පිළිබඳව අධ්‍යාපනය වඩාත් පුළුල් ලෙස බෙදා දීමේ වගකීම අපට පැවරී තිබෙනවා.

ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය ගැන පවතින මිථ්‍යාවන් මඟහැරවීම, කාන්තාවන්ට සහ පවුලේ සෞඛ්‍ය ආරක්ෂා කර ගැනීමට මඟපෙන්වීම, ලිංගාශ්‍රිතව සම්ප්‍රේෂණය වන රෝග - HIV/ඒඩ්ස් පිළිබඳ දැනුම - අවබෝධය ලබාදීම, දරුවන් බලාපොරොත්තුවෙන් සිටින එහෙත් දරුවෙකු නොමැති යුවළ සඳහා වෛද්‍ය උපදෙස් ලබාදීම මෙම වකවානුවේ ප්‍රධාන වශයෙන් අප සිදුකරන කාර්යයන් අතර වේ.

සමාජ අවශ්‍යතා අනුව අභියෝග බාර ගනිමින් පුළුල් පරාසයකට විවිධාකාර සේවා ලබාදීමට අපේ අරමුණයි. එමෙන්ම ඒ සඳහා මුහුණ දිය හැකි, හැකියාවන් දියුණු කරගත් පිරිසක් සිටින තැනක් බවට මේ ආයතනය පත්කිරීමත් මගේ බලාපොරොත්තුවයි.

"එසේම, ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ විධායක අධ්‍යක්ෂ ධූරය හදපිරි සතුටින් මා බාර ගත්තේ, කාලයක් තිස්සේ අලෙවිකරණ ක්ෂේත්‍රයේ මනා දැනීමකින් කටයුතු කළ මට, වෘත්තීමය ජීවිතයේදී, ශ්‍රී ලංකාවේ කාන්තාවන්ට යම් කිසි සුවිශේෂ මෙහෙවරක් කරන්නට විශාල ආසාවක් තිබුණා. මීට වසර ගණනාවකට පෙර වැඩ කරපු තැනක, හුරුපුරුදු තැනක, ආදරය කරපු තැනක, ඉහළම තනතුරට යෑමට හැකිවීම ගැන මට අතිශය සතුටක් දැනෙන්නේ"

**සාකච්ඡාවක් ඇසුරින් සකස් කරන ලදි**

# ලිංගික සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නව ප්‍රවනතා

ලිංගික සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නව ප්‍රවනතා පිළිබඳව වෛද්‍යවරුන් දැනුවත් කිරීම සඳහා FPA ශ්‍රී ලංකා වෛද්‍ය ඒකකය මගින් කොළඹ දී පැවැත්වූ වැඩමුළුවේ අවස්ථා කිහිපයක්...



විශේෂඥ වෛද්‍ය
ප්‍රාමිලා සේනානායක මහත්මිය



මහාචාර්ය
හර්ෂ සෙනෙවිරත්න මහතා



විශේෂඥ වෛද්‍ය
අතුල කළුආරච්චි මහතා



විශේෂඥ වෛද්‍ය
ලසන්ත මලවිගේ මහතා



වෛද්‍ය අධ්‍යක්ෂිකා සුමිත්‍රා තිසේරා මහත්මිය සහ මහාචාර්ය කාලෝ ෆොන්සේකා මහතා



සහභාගීවූ විද්වත් පිරිසෙන් කොටසක්

## ස්වේච්ඡා සේවිකාවන් සඳහා බයිසිකල් බෙදදීම

**ආලෝකය යොවුන් මිතුරු මධ්‍යස්ථානය, අම්පාර**
☎ 063 3638483

ලාහුගල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාසයේ ස්වේච්ඡා සේවිකාවන් 25 දෙනෙකු සඳහා බයිසිකල් පිරිනමන ලදි. මෙම පිරිස ප්‍රදේශයේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන්ගේ කාර්යයන්ට සහය ලබාදේ.



FPA ශ්‍රී ලංකා ආයතනයේ හිටපු සභාපති මේජර් ෂර්ලි සිල්වා මහතා බයිසිකල් ප්‍රදානය කරන අවස්ථාව

## ජ්‍යෙෂ්ඨ බාලදක්ෂිකාවන් සඳහා වැඩසටහන් 2011 සඳහා අම්පාර දිස්ත්‍රික් වැඩසටහන් ආරම්භ වේ.

ලියසවිය විශේෂ ව්‍යාපෘතිය යටතේ අම්පාර ප්‍රාදේශීය ලේකම් කොට්ඨශයේ බාලදක්ෂිකා වැඩසටහන ආරම්භ කිරීම සඳහා මූලික පියවර වශයෙන් විද්‍යාල 6ක් තෝරා ගන්නා ලදී. මෙම විද්‍යාලවලින් බාලදක්ෂිකා වැඩසටහන ආරම්භ කිරීම සඳහා නායිකාවන් වශයෙන් පුහුණුව ලබා නිල ලාංඡන පැළඳ දිවුරුම් දීමෙන් පසු ඡායාරූපයකට පෙනී සිටි අවස්ථාව.



මැදපෙළ වමේ සිට - මධුරලතා රඹුක්පොත මිය (පුහුණු කොමසාරිස්, පී. ජී. එන්. පී. දයාරත්න මහතා (කළමණාකාර - FPA ශ්‍රී ලංකා - අම්පාර) නිමල් රණතුංග මහතා (සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ - කලාප අධ්‍යාපන කොට්ඨාසය - අම්පාර), අමරා රණසූරිය මිය (කළමණාකාර් - ක්ෂේත්‍ර වැඩසටහන් ඒකකය), රම්‍යා අබේකෝන් මිය (හිටපු බාලදක්ෂිකා කොමසාරිස්)

## පවුල් සෞඛ්‍ය සේවිකාවන්ට පුවරු

අලෙවිකරණ ඒකකය මගින් ගාල්ල දිස්ත්‍රික්කයේ වැලිවිටිය දිවිතුර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාසයේ පවුල් සෞඛ්‍ය සේවිකාවන් සඳහා නාමපුවරු බෙදදීම නිදුකරන ලදී.




සහකාර අධ්‍යක්ෂ ෂර්ලි කුමාර මහතා නාම පුවරු පිරිණමන අවස්ථාව

# පුවත් සංග්‍රහය

FPA SRI LANKA
enriching relationships

ප්‍රජනක සෞඛ්‍ය පිළිබඳ තොරතුරු, වෛද්‍ය උපදෙස් හෝ උපදේශන සේවා ඔබ ඉන්නා තැන සිටම ලබාගැනීමට

අමතන්න 2 588 488

පිවිසෙන්න www.happylife.lk

SMS කරන්න 071 6 408 408


www.fpasrilanka.org

37/27, බුලර්ස් පටුමග, කොළඹ 07.
දුරකථන: 011 2 555 455  ෆැක්ස්: 011 2 55 66 11
ඊ මේල්: fpa@fpasrilanka.org


## ලියසවිය සහතිකපත් බෙදදීම

ආලෝකය යොවුන් මිතුරු මධ්‍යස්ථානය, මඩකලපුව
☎ 065 2226163






ලියසවිය ව්‍යාපෘතිය සාර්ථකව නිමකිරීම නිමිත්තෙන් මඩකලපුව දිස්ත්‍රික්කයේ තරුණියන් සඳහා සහතික පත් බොදදීම සිදු කරන ලද අවස්ථාව. මඩකලපුව ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ එස්. සතුර්මුගන් මහතා සභාව අමතන අයුරු සහ FPA ශ්‍රී ලංකා ආයතනයේ හිටපු සභාපති මේජර් ෂර්ලි සිල්වා මහතා සහතික පත් ප්‍රදනය කරන අයුරු. මෙම වැඩසටහන මඩකලපුව මධ්‍යස්ථානයේ කළමණාකාර කේ. යෝගේෂ්වරන් මහතා විසින් සංවිධානය කරන ලදි.

## හෝටල් පාසලේ ඉගෙනුම ලබන්නන් දැනුවත් කිරීම

ආලෝකය යොවුන් මිතුරු මධ්‍යස්ථානය, කොග්ගල
☎ 011 3159258



කොග්ගල රජයේ හෝටල් පාසලේ ඉගෙනුම ලබන්නන් සඳහා HIV හා ලිංගාශ්‍රිතව බෝවන රෝග පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදි. ගාල්ල දිස්ත්‍රික් මාතෘ හා ළමා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිනී වෛද්‍ය මානෙල් දේවසිරි මහත්මිය මෙහිදී විශේෂ දේශන පැවැත්වූවාය. හබරාදුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිනී ආශා ලක්මාලි මහත්මියගේ උපදෙස් පරිදි ආලෝකය කොග්ගල මධ්‍යස්ථානය මෙය සංවිධානය කරන ලදි.

## මරදනේ වෛද්‍ය කඳවුර

ආලෝකය යොවුන් මිතුරු මධ්‍යස්ථානය, කොළඹ
☎ 077 1050984


වෛද්‍ය සායනයේ අවස්ථාවක්


▲ මෙම කඳවුර පරික්ෂා කිරීමට පැමිණි IPPF දකුණු ආසියා කලාපීය කාර්යාලයේ අධ්‍යක්ෂිකා අංජලී සෙන් මහත්මිය නියෝජ්‍ය විධායක අධ්‍යක්ෂ ලසන්ත ගුණරත්න මහතා සමඟ

කොළඹ දිස්ත්‍රික් 2, කොට්ඨාසයේ සුදුවැල්ල, මාලිගාකන්ද, මරදන යන ප්‍රදේශවල වෙසෙන අඩු ආදයම් ලාභී ජනාවාස ආශ්‍රිත ජනතාව ඉලක්ක කර ගනිමින් ඔවුන්ගේ සෞඛ්‍ය තත්ත්වය නගා සිටුවීමට මෙම වෛද්‍ය කඳවුර පවත්වන ලදි. විශේෂයෙන් කාන්තාවන් උදෙසා, පැප්ස්මියර්, පිළිකා හඳුනාගැනීම සඳහා පියයුරු පරීක්ෂාව හා තවත් වෛද්‍ය පරික්ෂාවන් ගණනාවක් මෙම වෛද්‍ය කඳවුර මගින් සිදු කරන ලදි. සහභාගි වූවන් අතර කිසි දිනක රෝහලකට පර්යේෂණ කටයුතු සඳහා නොගිය පිරිස් ද වූහ. මෙම අවස්ථාවෙන් සේවා ලබා ගැනීම සඳහා 150කට වැඩි පිරිසක් සහභාගී වූහ.

## රණවිරුවන්ගේ මව්වරුන්ට හා බිරින්දෑවරුන්ට වෛද්‍ය සායනයක්



LiLi ව්‍යාපෘතිය යටතේ රණවිරුවන්ගේ මව්වරුන්ට හා බිරින්දෑවරුන්ට වෛද්‍ය සායනයක් පැවති අවස්ථාව. කළමණාකාරිනී සුනීතා රත්නායක මහත්මිය මෙය සංවිධානය කරන ලදි.

**ආලෝකය උපදේශන මධ්‍යස්ථානය**
**011 2 555 455**


සංස්කරණය: ආනන්ද බෝධිනායක - ananda@fpasrilanka.org
සම්බන්ධීකරණය: අධිවාචන (Advocacy) ඒකකය
FPA ශ්‍රී ලංකා ප්‍රකාශනයකි